**ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

# පුරප්පාඩු

## ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01. අධ්‍යක්ෂ (බලාත්මක කිරීම හා ක්‍රියාත්මක කිරීම)

**(පුරප්පාඩු 01)**

**i. රැකියා විස්තරය**

ආයතනය පිහිටුවීමට අදාළ වන පනත ඇතුළු අදාළ වන අනෙකුත් සියලු නීති රෙගුලාසි අර්ථකථනය කිරීම හා ක්‍රියාත්මක කිරීම, තහනම් ද්‍රව්‍ය සම්බන්ධයෙන් කටයුතු කරන ජාත්‍යන්තර ආයතන සමග එක්ව කටයුතු කිරීම, එම ආයතන හා එක්ව කාලානුරූපීව නීති රෙගුලාසි හා තොරතුරු යාවත්කාලීන කිරීම හා එම නියමයන් ශ්‍රී ලංකාව තුළ අනුගමනය කිරීම, තහනම් ද්‍රව්‍ය සම්බන්ධයෙන් අදාළ වන අප රටෙහි රාජ්‍ය ආයතන හා පෞද්ගලික ආයතන සමග සම්බන්ධීකරණයෙන් යුක්තව කටයුතු කිරීම, ආයතනය පිහිටුවීමට අදාළ වූ පනත මගින් පවරනු ලබන කාර්යයන් හා අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරා දෙනු ලබන ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්යයන් ක්‍රියාවේ යෙදවීම.

**ii. සුදුසුකම්**

**අ) බාහිර අයදුම්කරුවන්**

නීතිය / අපරාධ විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම

**සමග**

අදාල ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (Master) ලබා තිබීම සහ රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "**කළමනාකාර මට්ටමේ**" තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහළොවක (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

**ආ) අභ්‍යන්තර අයදුම්කරුවන්** (පහත සඳහන් 1 හෝ 2)

01. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
02. කළමනාකාර සේවා (MM) සේවා ගණයෙහි 1 වන ශ්‍රේණියෙහි තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**iii. වැටුප් පරිමාණය**

HM 1-1 - රු. 80,295 - 15x2,270 - 114,345

**iv. වයස**

අවු. 35 ට නොඅඩු හා අවු. 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**v. බඳවා ගැනීමේ ක්‍රමය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

---

### 02. සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ (අධ්‍යාපන හා පරීක්ෂණ)

**(පුරප්පාඩු 01)**

**i. රැකියා විස්තරය**

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ඉටු කරනු ලබන කාර්යයන් පිළිබඳව ක්‍රීඩක ක්‍රීඩිකාවන් දැනුවත් කිරීම ඒ හා සම්බන්ධ තාක්ෂණික දැනුම ලබා දීම, තහනම් උත්තේජක පරීක්ෂණ සැලසුම් කිරීම, සංවිධානය කිරීම, තහනම් උත්තේජක පරීක්ෂණ ප්‍රතිඵල අදාළ පරීක්ෂණාගාරවලින් ලබා ගැනීම හා ඊට අදාළ අනුශාංගික කටයුතු අධීක්ෂණය කිරීම හා ආයතනයේ අරමුණ ඉටු කර ගැනීමට අධ්‍යක්ෂ ජනරාල්වරායට අවශ්‍ය සහාය ලබා දීම.

**ii. සුදුසුකම්**

**අ) බාහිර අයදුම්කරුවන්**

ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය පිළිබඳ උපාධිය හෝ ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව විෂයක් වශයෙන් ඇතුළත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම

**සහ**

උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුදක් ලබා තිබීම.

**ආ) අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

**iii. වැටුප් පරිමාණය**

MM 1-1 රු. (53,175 - 10x1,375 - 15x1,910 - 95,575)

**iv. වයස**

අවු. 22 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය.

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**v. බඳවා ගැනීමේ ක්‍රමය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

---

### 03. සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ (බලාත්මක කිරීම හා ක්‍රියාත්මක කිරීම)

**(පුරප්පාඩු 01)**

**i. රැකියා විස්තරය**

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ඉටුකරනු ලබන තහනම් උත්තේජක පිටුදැකීම හා සම්බන්ධ ආයතන හා එක්ව කාලානුරූපීව නීති රෙගුලාසි හා තොරතුරු යාවත්කාලීන කිරීමට දායක වීම හා එම නියමයන් ශ්‍රී ලංකාව තුළ අනුගමනය කිරීමට කටයුතු කිරීම, තහනම් ද්‍රව්‍ය සම්බන්ධයෙන් අදාළ වන අප රටෙහි රාජ්‍ය ආයතන හා පෞද්ගලික ආයතන සමග සම්බන්ධීකරණයෙන් යුක්තව කටයුතු කිරීම.

**ii. සුදුසුකම්**

**අ) බාහිර අයදුම්කරුවන්**

නීතිය, අපරාධ විද්‍යාව පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම

**සහ**

උපාධිය ලබාගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

**ආ) අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

**iii. වැටුප් පරිමාණය**

MM 1-1 රු. (53,175 - 10x1,375 - 15x1,910 - 95,575)

**iv. වයස**

අවු. 22 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය.

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**v. බඳවා ගැනීමේ ක්‍රමය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

---

- **පොදු කොන්දේසි**

  i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.

  ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

  iii. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුයි.

- **අර්ථ සාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල**

  (අපේක්ෂකයන් විසින් 8% ක් හා ආයතනය විසින් 12% ක් අර්ථ සාධක අරමුදල සඳහා සහ 3% ක් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා ද දායක වනු ඇත)

  ❖ අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද අනුව කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්පත්, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ.

- **අයදුම්පත් ඉදිරිපත් කිරීමේ ක්‍රමය**

  අයදුම්කරුවන් විසින් සහතිකපත්, චරිත සහතිකවල පිටපත්, ඥාති නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ දූරකථන අංක ද සමග තම ජීව දත්ත තොරතුරු 2021.02.19 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ **අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය, 363/12, සුගතදාස ස්ටේඩියම් - බ්ලොක් ඩී, ක්‍රීඩා සංකීර්ණ රථගාල පාර, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, කොළඹ 14** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

  ❖ එසේ නොවන සහ අයදුම්පත් භාරගන්නා දිනට පසුව එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

  ❖ රජයේ දෙපාර්තමේන්තු / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අය තම අයදුම්පත් ඔවුන්ගේ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.

  ❖ අයදුම්පත බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන ලද තනතුර සඳහන් කළ යුතුය.

  ❖ මේ පිළිබඳව බලපෑම් කිරීම නුසුදුසුකමක් වනු ඇත.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය.**